සංවාදය :- **සමන් රංචාගොඩ**



# සටන් විරාම ගිවිසුම ලෙහෙසියෙන් ඉරා දමන්න බැහැ

***එම්.කේ.සිවාපිලිංගම්***

*ද්‍රවිඩ එක්සත් සන්ධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී*

මහින්ද රාජපක්ෂ රජය යටතේ ශ්‍රී ලංකාවේ සාමය පිළිබඳව යළිත් වරක් බලාපොරොත්තු දැල්වෙමින් තිබේ. ඒ සඳහා වූ මූලික සාකච්ඡා පසුගියදා ජිනීවා නුවර දී පැවැත්විණ. එහිදී ගත් වැදගත් තීරණයක් වන්නේ සටන් විරාම ගිවිසුම ශක්තිමත්ව තවදුරටත් පවත්වාගෙන යාමට දෙපාර්ශවයම එකඟවීමයි. එනමුත් මේ සම්බධයෙන් උතුරේත් දකුණේත් ඇතැම් කොටස් වලත් ප්‍රතික්‍රියා එකිනෙකට පරස්පරය. මේ ඒ සම්බන්ධයෙන් ද්‍රවිඩ සන්ධානයේ යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.කේ. සිවාපිලිංගම් සමඟ සන්නස වෙනුවෙන් කළ සාකච්ඡාවකි.

**ප්‍රශ්නය** :- *රජයේ නියෝජිතයින් සහ එල්.ටී.ටී.ඊ. නියෝජිතයින් අතර ජිනීවා නුවර දී පැවැති සාකච්ඡා සම්බන්ධයෙන් ඔබගේ අදහස?*

**පිළිතුර** :- මං කියන්නෙ ජිනීවා සාකච්ඡා වලින් එකඟ වූ පරිදි දෙපාර්ශවයම සටන් විරාම ගිවිසුම හරියට ක්‍රියාත්මක කිරීමට කැපවිය යුතුයි. ඒ අනුව ඝාතන හා පහරදීම් නතර කළ යුතුයි. දෙපාර්ශවයම දෙපාර්ශවය පිළිබඳව විශ්වාසය තහවුරු වෙන විදියට කටයුතු කළ යුතුයි. එසේ වුවහොත් මේ පටන් ගත් සාම වැඩපිළිවෙළ සාර්ථක වෙමි.

**ප්‍රශ්නය** :- *මෙවර සාකච්ඡා සඳහා රජය දැඩි පූර්ව සූදානමකින් ගියත් එල්.ටී.ටී.ඊ. සංවිධානය තුළ එවැනි පූර්ණ සූදානමක් නොතිබුණු බවත් ඒ නිසා ඔවුන් රජයේ නියෝජිතයින් හමුවේ කිසියම් අපහසුතාවකට පත්වූ බවත් කියැවෙනවා. එය ඇත්තක්ද?*

**පිළිතුර** :- එබඳු දෙයක් විය නොහැකියි. කවර ආණ්ඩුවක් යටතේ සාකච්ඡා සඳහා පැමිණියත් එල්.ටී.ටී.ඊ. සංවිධානය ඒ සඳහා මනා පෙර සූදානමකිනුයි පැමිණෙන්නේ. එමනිසා අලුත් ආණ්ඩුව යටතේත් සාම සාකච්ඡා සඳහා ඔවුන් අලුත් පිරිසක් මනා ලෙස පුහුණු කරලයි එව්වේ.

**ප්‍රශ්නය** :- *එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මතු කරන අතුරු හමුදා සම්බන්ධයෙන් වූ ප්‍රශ්නයට රජය පැත්තෙන් වන විසඳුම කුමක්ද?*

**පිළිතුර** :- එවැනි ආයුධ සන්නද්ධ කල්ලි නිරායුධ කිරීමට රජය එකඟ වී තිබෙනවා.

**ප්‍රශ්නය** :- *මෙහිදී රජය කියා ඇත්තේ රජයේ හමුදා නොවන සියලු ආයුධ සන්නද්ධ කල්ලි නිරායුධ කිරීමට පියවර ගන්නා බව. එහිදී එල්.ටී.ටී.ඊ. සංවිධානයත් ඊට අයත් වෙනවා නේද?*

**පිළිතුර** :- රජයේ පාලන ප්‍රදේශවල අවි ආයුධ තබාගෙන සිටින්නේ රජයේ හමුදා විතරයි. ඊට පරිබාහිරව වෙනත් පාර්ශව අවි ආයුධ තබා ගෙන සිටියොත් නිරායුධ කරනවා කියලයි රජය කියන්නෙ. එහි ගැටලුවක් නෑ. එල්.ටී.ටී.ඊ. සංවිධානය රජයේ පාලන ප්‍රදේශවල අවි ආයුධ සහිතව පැමිණින්නේ නැහැනේ? තමන්ගේ පාලන ප්‍රදේශවල එල්.ටී.ටී.ඊ. සංවිධානය ආයුධ තබාගෙන සිටීම මීට අදාළ නෑ.

**ප්‍රශ්නය** :- *ජිනීවා සාකච්ඡාවලදී එල්.ටී.ටී.ඊ. නියෝජිතයින් විසින් දක්වා සිටි ඇතැම් කරුණු ජාතික හා ඇතැම් පුද්ගල ජීවිතවල ආරක්ෂාවට බරපතල තර්ජනයක් බවයි සන්ඩේ ලීඩර් පුවත්පතේ ලිපියකින් දැක්වුණේ. ඒ පිළිබඳව ඔබට කියන්නට ඇත්තේ කුමක්ද?*

**පිළිතුර** :- මේ සම්බන්ධයෙන් සන්ඩේ ලීඩර් පුවත්පතට වැරැද්දක් කියන්න බෑ. මන්ද ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ තොරතුරු හෙළිකිරීමට ඔවුන්ට අයිතියක් තියෙනවා. එමනිසා ජිනීවා සාකච්ඡාවලදී හෙළිවුණු ඇතැම් කරුණු බුද්ධි අංශ නිලධාරීන්ගේ ජීවිතවලට තර්ජනයක් නම් රජය කළයුතු වෙන්නේ ඒ අයගේ ආරක්ෂාව තර කරන එකයි. එහි වගකීම මුළුමණින්ම රජයටයි පැවරෙන්නෙ.

**ප්‍රශ්නය** :- *හෙළ උරුමය සහ ජ.වි.පෙ. මහින්ද රාජපක්ෂ සමඟ සන්ධාන ගතවුණේ අර්ථාන්විත සටන් විරාම ගිවිසුමක් නැවත ඇතිකර ගැනීමේ පදනම මත. එනමුත් දැන් සිදුවී ඇත්තේ පැවැති සටන් විරාම ගිවිසුමම නැවතත් පිළිගැනීම. මේ සම්බන්ධයෙන් හෙළ උරුමය සහ ජ.වි.පෙ. දැනටමත් සිය විරුද්ධත්වය ප්‍රකාශ කරමින් තිබෙනවා. මේ තුළ රජය අස්ථාවර වී සාකච්ඡා බිඳ වැටෙයිද?*

**පිළිතුර** :- මේ සටන් විරාම ගිවිසුම අවුරුදු 4 ක් තිස්සේ දැන් පිළිගෙන තිබෙනවා. මෙය රජය සහ එල්.ටී.ටී.ඊ.ය යන දෙපාර්ශවය විසින් පමණක් ඇති කරගත් දෙයක් නෙමේ. ජාත්‍යන්තර ප්‍රජාවත් මේ තුළ සිටිනවා. එම නිසා මෙම ගිවිසුම ලෙහෙසියෙන් ඉරා දැමිය නොහැකියි. මෙම සටන් විරාම ගිවිසුම නිසා ජීවිත දහස් ගණනක් මරණයෙන් ගැලවී තිබෙනවා. එමනිසා මෙම සටන් විරාම ගිවිසුම ශක්තිමත්ව ඉදිරියට පවත්වාගෙන යමින් මෙරටට සාමය උදාකර ගැනීමේ බලාපොරොත්තුව තමයි අප තුළ තිබෙන්නේ.

**ප්‍රශ්නය** :- *ජනාධිපතිවරණයට පෙර මහින්ද රාජපක්ෂ පිළිබඳව ද්‍රවිඩ ජනතාව තුළ තිබුණේ, වෙනමම ආකල්පයක් නේද? දැන් එය වෙනස් වී ඇත්ද? ඔහුට සාමය උදා කිරීමට හැකිවේ යැයි ද්‍රවිඩ ජනතාව විශ්වාස කරනවාද?*

**පිළිතුර** :- ඡන්දෙ කාලෙ එක එක කතා එළියට ආවා. ඒ අනුව තමයි ජනතාව යම් යම් ආකල්ප වලට එන්නේ. එනමුත් දැන් තත්ත්වය වෙනස්. එල්.ටී.ටී.ඊ. එක මහින්ද රාජපක්ෂට අවස්ථාවක් දුන්නා. මහින්ද රාජපක්ෂ එය පිළිගත්තා. දැන් දෙපාර්ශවයම සාකච්ඡාවලට ප්‍රවේශ වී සිටිනවා. මේ තුළ ඔහුට සාමය උදාකළ හැකියැයි යන විශ්වාසයෙන් අප සිටිනවා.

**ප්‍රශ්නය** :- *ප්‍රහාර නැවැත්වීමටත්, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම නතර කිරීමටත් ජිනීවා සාකච්ඡාවලදී එල්.ටී.ටී.ඊ. සංවිධානය එකඟ වූවත් ඔවුන් තවදුරටත් එම එකඟතා කඩ කරමින් සිටිනවා නේද?*

**පිළිතුර** :- එවැනි දේවල් සිදුවෙනවා නම් ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සටන් විරාම නිරීක්ෂණ කමිටුව සිටිනවා. ළමා සොල්දාදුවන් බඳවා ගැනීම පැත්තෙන් යුනිසෙෆ් සංවිධානය ඉන්නවා. එමනිසා ඒවාට එරෙහිව අවශ්‍ය පියවර ගැනීම ඔවුන් සතු වගකීමක්.

**ප්‍රශ්නය** :- *උතුරු නැගෙනහිර ධීවර කටයුතු ජාතික ආරක්ෂාවට තර්ජනයක්. මන්ද ධීවර වෙසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයද පැමිණ ප්‍රහාර දියත් කිරීමට ඇති ඉඩකඩ නිසා එවන් තත්ත්වයක් තුළ එම ප්‍රදේශවල ධීවර කටයුතුවලට ඉඩදෙන්න කියා ඔබලා විසින් කරනු ලබන උද්ඝෝෂණ සාධාරණද?*

**පිළිතුර** :- ධීවර වෙසින් පැමිණ එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රහාර එල්ල කරනවා යැයි කීම බොරුවක්. ඔවුන්ට එසේ එන්නට හැකියාවක් නෑ. මන්ද නාවික හමුදාවට හැකියාව තියෙනවා ඒ පිළිබඳව සොයා බලන්නට. ධීවරයන් තම ධීවර කටයුතු සඳහා පැමිණිය යුතු වන්නේ අදාල හැඳුණුම්පත් පෙන්වා. ඊටපසු මුහුදේදීද නාවික හමුදාවට පුළුවන් එම ධීවරයන් පරීක්ෂා කරන්න. එමනිසා එල්.ටී.ටී.ඊ. සංවිධානය මේ සඳහා ගැටලුවක් නොවේ. උතුරේ ධීවරයන්ට තම ධීවර කටයුතු සඳහා ඉඩකඩ ලබාදිය යුතුයි. අපි එම ඉල්ලීම රජයෙන් කරල තියෙනවා.

**ප්‍රශ්නය** :- *අප්‍රේල් පැවැත්වීමට යෝජිත දෙවන වටයේ සාකච්ඡා සම්බන්ධයෙන් සූදානම් විය යුතු ආකාරය පිළිබඳව රජය සහ එල්.ටී.ටී.ඊ. යන දෙපාර්ශවයටම ද්‍රවිඩ සංවිධානය වශයෙන් ඔබලාට කියන්නට ඇත්තේ කුමක්ද?*

**පිළිතුර** :- දෙපාර්ශ්වයම දෙපාර්ශ්වය අතර විශ්වාසය තහවුරු කරගත යුතුයි. එය කළ හැකි වන්නේ සටන් විරාම ගිවිසුම හැකිතාක් හොඳින් ආරක්ෂා කිරීම තුළයි. එසේම එක්සත් රජයක් තුළ බලය බෙදා හරිමින් අන්තිම විසඳුමක් කරා ළඟාවීමට දෙපාර්ශ්වයම කැපවිය යුතුයි. ■

## සන්නස පුවත්පතට ලියන ඔබටයි මේ

පුවත්පත් සඳහා ලිපි බාරගන්නා අවසාන දිනය සෑම මසකම 25 වන දින බව කරුණාවෙන් සලකන්න.







**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

WA
Kapila Hemantha Balage
08 9456 1972

QLD
Ananada Samaratunga
07 3372 7953

ACT
Asoka Nimalasiri
0439 925 241

SA
Chandta Eeriyagama
08 8331 2318

TAS
Anura Seneviratne
03 6327 4259

**සන්නස පිරිවර**

| | |
|---|---|
| අනුර හොරේෂස් | Anura Horetious |
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| ඩබ් ක ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| චන්දි මාපා | Chandi Mapa |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |



සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



SANNASA
අපේ උරුමය වෙනුවෙන්

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe



**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569